75. The setting of spring guns and spring bows, pit-falls, and going in minipandama, is hereby prohibited except with the special permission of the President or Chairman, who shall give public notice in the village that such license has been granted. Provided that spring guns, &c., may be set for the destruction of cheetahs, on a license in writing from the arachchi, who shall give notice in the village that such license has been granted.

SUB-SECTION 12.—GAMBLING, COCK-FIGHTING, &C.

76. Unlawful gaming, as defined by section 3 of Ordinance No. 17 of 1889, is prohibited. No person shall allow cock-fighting, whether for a stake or not, or playing a game for a stake, or betting to be practised in his house or premises.

77. No cart or hackery racing shall be permitted in any public thoroughfare.

SUB-SECTION 13.—COURT-HOUSES.

78. The construction, repair, and maintenance of court-houses for village tribunals or village committees shall be affected as a communal work under rule 1.

79. No person shall allow cattle, goats, or sheep to trespass on Gansabhawa buildings. Any person who prosecutes under this rule shall be entitled to half of the fine inflicted.

SUB-SECTION 14.—DUTIES OF OFFICERS APPOINTED BY INHABITANTS.

80. If any officer appointed under sections 10 and 11 of the principal Ordinance, or any headman neglects to perform any of the duties imposed on him by these rules, he shall be liable to a fine.

81. Every officer found guilty of wilfully abusing or exceeding the powers vested in him by these rules, or refusing or neglecting to obey these rules, shall be liable to a fine.

82. Any headman who resigns, is dismissed, removed from office, or suspended, shall within three days of his removal from office return to the President or the Chairman of the Village Committee his register, copies of all the Ordinances, and rules, and all other official papers and obtain a receipt.

SUB-SECTION 16.—ROADS.

83. It shall be lawful for the committee of any division or for the committees of two or more divisions from time to time to determine that a natural road not more than twelve feet wide shall be made from any place to any other place in such division or divisions, and to decide on the width of the road and its course. The work shall be carried on as a communal work under rule 1.

84. The committee shall determine the number of days' labour, less than ten days' labour in all in any one year, to be contributed by each person to be benefited by such road, and every such person shall be bound to contribute his labour as so determined.

SUB-SECTION 17a.—ANNUAL TAX.

85. It shall be lawful for any person who is liable to contribute labour under these rules to commute the whole of such communal labour for the year by payment of a sum of 75 cents if paid before March 31 of each year, or of Re. 1·25 if paid before June 30. Provided that if called out to work before either of these dates, he must make the payment before the date fixed for commencing the work.

86. Every male inhabitant between the ages of 18 and 56 shall be liable to perform labour upon any work in which the committee shall decide that he is interested, at such times and for such periods as the committee shall determine subject to rule 84.

87. The arachchi of each wasama shall before January 1 in each year prepare a list of all males residing in his wasama between the ages of 18 and 56, and shall forward a copy thereof to the President or Chairman of the Village Committee.

88. Priests of all religions and all other persons exempted from labour under the Road Ordinance, No. 10 of 1861, shall be exempt from liability to labour under these rules. The President or Chairman of the committee shall decide on all claims for exemption.

89. The arachchi, the korala, or Ratemahatmaya, as the case may be, shall fix the day for the commencement of such communal work, and shall serve a notice in form annexed (A) upon each person liable to labour (or if he be absent from the village, upon some member of his household), calling upon him to render the labour due by him at a certain place and time.

90. No person liable to perform any labour under these rules shall fail to attend at the place named and perform a quantity of work sufficient for a day.

91. The person in charge of communal work shall report to the President or Chairman of the Village Committee the completion of the work, and shall forward a return in form annexed (B) with a list of defaulters in form annexed (C).

92. The person in charge shall furnish a receipt for labour contributed (Form D) and for money paid as commutation (Form E).

93. Any person liable to pay local sanitary rates under Ordinance No. 18 of 1892 shall only be liable to contribute half the labour imposed, or to pay half the commuted sum under these rules.

SUB-SECTION 18.—LOITERING IN THOROUGHFARES.

94. No person shall loiter in a thoroughfare or public place or walk about the same after 9 P.M. without a light, and without being able to show sufficient cause for so doing.

SUB-SECTION 20.—SALE OF SPIRITS.

95. The sale within the division to females of any description of spirits, including intoxicating liquor as well as the products of the cocoanut or other description of palm or of the sugarcane, is hereby forbidden.

SUB-SECTION 21.—FOR THE ENFORCEMENT OF ANCIENT CUSTOMS AS REGARDS CULTIVATION.

96. The committee shall have power to fix the time according to ancient custom when fields shall be ploughed and sown, and the ploughing and sowing shall be done at the time fixed by them.

SUB-SECTION 22.—VILLAGE AFFAIRS.

97. When a range of hen is cleared in common, no person shall set fire to it until the time of firing has been settled by a majority of the cultivators.

98. Driving game, except with the permission of the Ratemahatmaya, is strictly prohibited.

99. The owner of any land on which game is killed shall be entitled to receive a hind quarter of every animal so killed.

100. When any one of a party of hunters kills any domestic animal by accident, half the value of such animal shall be paid by the person who killed the animal, and the other half, in equal shares, by the rest of the party.

101. Public tavalam mandiyas and private tavalam mandiyas shall be kept clean by the person or persons using them.

102. The inhabitants of every village to which this rule is applicable shall keep the ground round the gama or gangoda to a distance of thirty fathoms from the fence clear of jungle by communal labour.

103. It shall be the duty of every householder to keep his premises clear of filth and jungle and properly drained for a distance of ten fathoms from his house and to put up a fence round the premises.

104. Every owner or occupier of land in which a private well or pit is situated shall protect such well or pit with a wall or fence at least 2½ feet high, and shall cause such well to be cleaned at least once in every year. If any person convicted under this rule fails to so protect or cleanse such well

or pit, the President or Chairman of the Village Committee shall cause the village headman to carry out the same, and the expenses incurred shall be recovered from the person so convicted.

105. The arachchi of the division shall report to the Ratemahatmaya every fresh arrival of a stranger to his wasama.

106. Trustees of temples, and any person or persons who get up or manage festivals, peraheras, pinkamas, ankeliyas, or other gathering of a large number of people, shall be bound to put up a sufficient number of latrines to accommodate the male and female population who attend such festival or gathering, and to provide scavengers to keep the ground cleared of nuisances. The compartments for females shall be apart from those set apart for males.

107. It shall be lawful for the President or the Chairman of the Village Committee at any time to call for and examine all works, registers, and other Government papers in the possession of any headman.

108. No person promising to engage himself as a cooly for any work connected with, or relating to, purely village affairs, shall break his promise.

109. The following fees shall, in terms of section 12 of Ordinance No. 24 of 1889, be recoverable by persons appointed by the Government Agent to offices created under section 10 of the said Ordinance :—

Keeping a head of cattle, 12 cents per day.
For permit to slaughter, 25 cents.
For cattle trespass report, 25 cents, with 10 cents for each mile beyond three from the officer's house to the land trespassed on.
For taking care of a head of sick cattle, 25 cents per day.
For burying a dead animal, Re. 1·50 from the owner and Re. 1 from the village committee fund.

---

FORMS.

A.

To ———.

Notice is hereby given that you are required to attend at 6 A.M. on ——— and the following ——— days to perform labour at ——— from ——— to ———, unless you have been previously exempted by commutation of labour, in terms of the Ordinance No. —— of ———.

——— ———
Officer.

B.—Final Return of Labour under Ordinance No. 24 of 1889.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| No. | Name of Police Officer. | No. of Men liable. | No. exempted by V. C. | No. capable of working (Col. 3 less Col. 4.) | No. worked. | No. paid. | No. fined. | No. imprisoned. | Total of Columns 6 to 9. | No. died. | No. worked elsewhere. | No. paid elsewhere. | Total of Columns 11 to 13. | No. unaccounted for. | Remarks. |
| | | | | | | | | | | | | | | | |

C.—Village Committee's Defaulters' Return.

——— Village, ——— Pattu, ——— Korale, ——— District, for ——— 19 —.

| No. in Roll. | Name of Defaulter. | Village. | Date of issue of Notice. | Date of Service. | On what Dates and at what Places ordered to work. | To be filled up by Chief Headman. | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | No. of Case. | Result of Case. |
| | | | | | | | |

D.

| CERTIFICATE OF LABOUR. | CERTIFICATE OF LABOUR. |
|---|---|
| | This is to certify that the under-mentioned person has duly performed —— days' labour due by him for the year 1 —— :— |
| No. —— | No. —— |
| Village : —— | Village : —— |
| Name : —— | Name : —— |
| Time worked : —— | Time worked : —— |
| With what working party : —— | With what working party : —— |
| | —— Signature of Officer in charge. |

E.

| VILLAGE LABOUR RECEIPT. *Commutation.* | VILLAGE LABOUR RECEIPT. |
|---|---|
| | Received from the under-mentioned person the sum of Rs. ——, being Money paid under Village Council Rules in Commutation of Labour due :— |
| No. —— | No. —— |
| District : —— | District : —— |
| Pattu : —— | Pattu : —— |
| Village : —— | Village : —— |
| Name : —— | Name : —— |
| Date of Payment : —— | Date of Payment : —— |
| Rs. —— | —— Signature of Collector. |

F.—Special License to Slaughter Animals.

The bearer —— has permission to slaughter the under-mentioned animal at ——, on the conforming himself to the Ordinance No. 9 of 1893 and the Gansabhawa rules :—

| Description. | Colour. | Age. | Brandmarks. | Remarks or Conditions. |
|---|---|---|---|---|
| | | | | |

—— Korala.

G.—Return of Animals slaughtered to be kept by the Korala.

| Date of Admission. | Date of Purchaser. | Description. | Colour. | Age. | Brandmark. | No. of License. | Name of Person Slaughtering. | From whom purchased. | Seller's Place of Residence. | Date of Slaughter. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

## H.

I,[1] ——— having been informed on the ——— day of ——— at ——— o'clock, by ——— of ———, that certain cattle had on the ——— day of ——— at ——— o'clock trespassed on the land called ———, in the Village of ———, in the District of ———, within the jurisdiction of the Police Court of ———, claimed by ———, proceeded to the spot where the damage was done, and with the assistance of ——— of ——— and ——— of ———, as Assessors, assessed the damage done.

The land trespassed upon was a [2] ——— planted with [3] ———; we found that the ——— was [4] ——— destroyed, and we assessed the amount of damage done at Rupees ——— as follows :—

| Crop, Plantation, &c., Destroyed. | Value. Rs. | c. |
|---|---|---|
| | | |

The cattle were ———; they are said to belong to the parties mentioned below; we saw ——— head branded as stated :—

| Description of Cattle. | Brandmarks. | Name of Owner as ascertained by us. |
|---|---|---|
| | | |

REMARKS.[5]

We found the land [6]

Given under my hand at ———, this ——— day of ———, 19 —.

*Signature with name of Office* } ———.

[1] Name and Office.

[2] "Field," "garden," *or* "chena."

[3] "Growing crop" *or* "plants" *giving particulars.*

[4] "Wholly" *or* "partially."

[5] State how any cattle seized were disposed of, and if owners were sent for and informed of damage done.

[6] "Not fenced," *or* "partially fenced," *or* "well fenced," *or according to circumstances.*

---

[Rules made under the provisions of the 6th section of "The Village Communities' Ordinance, 1889," for the Province of Uva.]

වර්ෂ 1889යේ අවුරුද්දේ නොම්මර 24 ආඥපනතේ තුන්වෙනි පරිච්ඡේදේ හයවෙනි කාණ්ඩේ පළමුවෙනි සුළු කාණ්ඩේ සඳහන්කර තිබෙන පොදු වැඩ සෑදීමද අළුත්වැඩියා කෙරීමද වැඩිදියුණු කෙරීමද සුළු කොට්ඨාසයේ කොමිටිය විසින් නියමකරන ඒ වැඩවලින් ප්‍රයෝජන ලබන්නාවූ අයවළුන් සෑමදෙනා විසින්ම එකතුව එකිනෙකාගේ අතින්ම කරන්නට ඕනෑය.

2. අත්වැල් සෑදීමද ආරක්ෂාකෙරීම සහ අළුත්වැඩියා කෙරීමත් නොම්මර 1යේ ව්‍යවස්ථාවේ ප්‍රකාර කරන්නට ඕනෑය.

3. එක එක සුළු කොට්ඨාසයේ සභාපතිතැන සහ කොමිටිය විසින් හෝ කොමිටියේ ප්‍රධානතැන සහ කොමිටිය විසින් සුළු කොට්ඨාසයේ සියළුම දෙනා විසින් කළයුතු වැඩවල ලැයිස්තුවක්ද, සුළු කොට්ඨාසයෙන් පඟුවක හෝ පඟු කීපයක අය විසින් කළ වැඩවල ලැයිස්තුවක්ද සෑදිය යුතුයි. එකී ලැයිස්තු කොමිටියේ කැමැත්තේ අන්දමට වෙනස්කළ හැකිය. යම් වැඩක් කෙරීමට බැඳීසිටින්නන් හෙවත් එයින් ප්‍රයෝජන ලබන්නෝ සුළු කොට්ඨාසය තුල වැසි සියළුදෙනාද, හෙවත් එයින් මොන පඟුවක හෙවත් පඟුවල අයවල්ද යන වග කොමිටිය විසින් නියමකර සාදනලද ලැයිස්තුවේ ප්‍රකාර වියයුතුයි. මෙසේ කොමිටිය විසින් නියමකරන යම් තීන්දුවකට විරුද්ධව ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේට ඇපෑල් ගත්විට වෙනස්කළ හැකිය. වැඩ කරන්ට යටත් යම් කෙනෙක් විසින් විභාගකළ විටක ඒ අය විසින් කරන්ට ඕනෑ වැඩේද, වැඩ කරන්ට ඕනෑ දවස් ගනනද දැන්වීම කොමිටියේ සෑම සමාජිකයින්ගේම යුතුකම වේ.

4. එක ගමක් නොහොත් ආරච්චිවසමක් සම්බන්ධව කරන වැඩක් නම් වසමේ ආරච්චිල බාරේද, එක වසමකට වැඩි ගනනක නම් කෝරාල බාරේද සහ එක කෝරලයකට වැඩිනම් රටේමහත්මයා බාරේද වැඩ කරන්නට ඕනෑය.

5. ගමේ සෑම ගම් පාරවල්ද, පාලම්ද, ඒදඬුද, අම්බලම් නොහොත් මඩම්ද, පීලිද, ලින්ද, වතුර ගන්නා සහ නාන ස්ථානද, තොටුපල්ද, ඔරු වලින් එගොඩකරන ස්ථානද සහ වෙනත් පොදු දේවල්, ඒවා තිබෙන්නාවූ ගමේ ආරච්චිල බාරේ තිබෙන්නට ඕනෑය. කලින්කලට ඒවාට ඕනෑකරන් නාවූ අළුත්වැඩියා කෙරීම ගැන සහ ඉහතකී දේවල්වලට යම් අනතුරක් කර තිබෙනවානම් ඒ ගැනද, භාරකාර මුලාදෑනියා විසින් සභාපතිතැනට හෝ ප්‍රධානතැනට රිපෝර්තු කරන්නට ඕනෑය.

6. යම් පොදු දේක පාවිච්චිය නවත්වන්ට හෝ නොසැලකිලිකමෙන් හෝ ක්‍රෝධ අදහසින් ඒ දේට අනතුරු කරන්ට කිසිම කෙනෙකුට යුතුනැත.

7. යම් ගම්පාරකට කැමැත්තෙන්ම අනතුරු කරන්ටවත් ඒක වහදමන්ට වත් ක්‍රමක්‍රමයෙන් එකී පාර අල්ලාගන්ටවත් අවලක්‍ෂන කරන්ටවත් කිසිවෙකුට යුතුනැත.

8. ප්‍රසිද්ධ පාරක් නොහොත් අඩිපාරක් වැටී තිබෙන්නාවූ හේනක් වැඩ කරන විට ඒ පාර වෙන අතකට හරවන්ට නොහොත් වෙන අන්දමකින් වෙනස්කරන්නට යුතුනැත. ඕනෑකරන ස්ථානවල කඩුළුපාර හරහට හොඳ කාර සාදන්ට ඕනෑවා සහ පාර එළිකරන්නට ඕනෑය.

9. යම් බෝවෙන රෝගයක් වැලඳී තිබෙන කෙනෙකුට ප්‍රසිද්ධ තොටු පලකවත්, මන්කඩක, ලිඳක නොහොත් පීල්ලක නාන්ට නොහොත් රෙදි සෝදන්ට කිසිවෙකුට යුතුනැත.

10. ඇලක, උල්පොතක, වතුරපාරක, ප්‍රසිද්ධ තොටුපලක, මන්කඩක, ලිඳක නොහොත් පීල්ලක කැතකරන්ට කිසිවෙකුට යුතුනැත.

11. උල්පත්වල සහ වතුරපාරවල්වල ප්‍රවේසම සඳහා ඉතුරුකර තිබෙන ගස් සහ කැලෑ කපන්ට නොහොත් නාසකරන්ට කිසිවෙකුට යුතුනැත.

12. කඩවලද, වෙලඳපලවල්ද, හරක් හෝ බැටළුවෝ හෝ ඌරෝ මරන ස්ථානවලද, ඒ ඒ ස්ථාන වටකර තිබෙන බිම්ද, ඒ ඒ කඩවල්, වෙලඳපලවල් සහ මරන ස්ථාන ආදියේ පදිංචි අයවළුන් විසින් සෑමවේලේම පිරිසිදුව තබාගන්නට ඕනෑය.

13. නොම්මර 12හේ ව්‍යවස්ථාවේ අන්දමට පිලිවෙලට තැබීම සහ ඒ අන්දමට පිලිපදින වග බලාගැනීම වසමේ මුලාදෑනියාගේ යුතුකමක්ය.

14. සෑම පොදු ලින් වටේට අඩි තුනකට අඩුනොවෙන උස ඇති වැටක් නොහොත් තාප්පයක් කොම්පිය විසින් නියමකරණ අයගේ පොදු මහන්සි යෙන් සාදන්ට ඕනෑය. පාළුවට ඇර තිබෙන සෑම ලින්ම ගොඩකරන්නට ඕනෑය.

15. ගමක නොහොත් ගම් කීපයක මෘතශරීර වැලලීමට හෝ දවා පිලිස්සීමට සොහොන්භූමි කොම්පිය විසින් තෝරාගෙණ ඒ බව ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේට රිපෝර්තුකරන්ට ඕනෑය.

16. ගමේ සොහොන්භූමිය වටේ වැටබැඳීම සහ එහි වල් එළිකෙරීමත් පොදු වැඩක් මෙන් කරන්නට ඕනෑය. රහස් සොහොන්භූමිවල වැට බැඳීම සහ එහි වල් එළිකෙරීම ඒ අයිති පවුලේ ප්‍රධානයා විසින් හෙවත් ඒ අයිති ආගම් හෝ සමාගම්වල භාරකාරයන් විසින්වත් ඒවා අයිති පන්සලේ භාර කාරයන් විසින් හෝ පන්සලේ ප්‍රධාන සංඝයාවහන්සේ විසින් කරන්නට ඕනෑය.

17. වයස හත සහ 14 අවුරුද්දට ඇතුලත් ලමයින්ගේ දෙමවුපියෝ නොහොත් භාරකාරයෝ විසිපස්දෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ඉස්කෝල යක් තැබීමට කොම්පියෙන් පෙත්සමක් දී ඉල්ලාසිටි විට කොම්පිය විසින් ඒජන්තඋන්නාන්සේගේ මාර්ගයෙන් ගෙවීමක් නැතුව ගුරුවරයෙක් සහ ඉස්කෝලයට ඕනෑකරන බඩු ආදියත් ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ ඩිරෙක්ටර්තැනගෙන් ඉල්ලුම්කල යුතුයි.

18. සෑහෙන කාරණ පෙන්නා සිටියේනම් මිස නැත්නම් ඉස්කෝලයට ලමයි එවන්ට බැඳීසිටින දෙමවුපියෝ සහ භාරකාරයෝ සිටින කොට්ඨාසයේ මායිම් කොම්පිය විසින් නියමකරන්ට ඕනෑය. එකී මායිම ඉස්කෝලයේ සිට හැතැප්ම තුනකට වැඩිනොවිය යුතුයි.

19. ඉස්කෝලයක් තැබීමට ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේ අවසර දුන් විට කොම්පිය විසින් සෑහෙන හොඳ ඉස්කෝලගෙයක් සාදන්ට ඕනෑය. එසේ සාදනලද ඉස්කෝලගෙය සෑදීමද ප්‍රවේසම් කෙරීම සහ අළුත්වැඩියා කෙරීමත් පොදු වැඩක් මෙන් කලයුතුයි. මෙයාකාර සාදන ඉස්කෝලයක් ගම්සභා ඉස්කෝලයයි කියා නම්වේ.

20. නොම්මර දහඅටේ ව්‍යවස්ථාවේ ප්‍රකාර මායිම් නියමකල කොට්ඨාසයේ එම මායිම් තුල සිටින වයස අවුරුදු 7ටත් 14ටත් අතරේ සෑම පිරිමිලමයින්

ගේ සහ ඔවුන්ගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරාදීන්ගේ නමුත් සඳහන් සම්පූර්ණ ලැයිස්තුවක් ඒ ගමේ නොහොත් ගම්වල මුලාදෑනියා විසින් සාදා සෑම අවුරුදුවලම ජනවාරි මාසේ 1 වෙනි දින හෝ ඊට මත්තෙන් සකෝලේ ගුරුවරයාට අරින්ට ඕනෑය.

21. කොම්පිය විසින් නියමකර තිබෙන මාසිම් තුල පදින්චි සෑම දෙමවුපියෝ සහ භාරකාරයොත් සෑහෙන කාරණ පෙන්නා සිටියේනම් මිස නැතිනම් වයස අවුරුදු 7 සහ 14ටත් අතරේ ඔවුන්ගේ පිරිමිලමයි ඉහතකී ප්‍රකාර තබන්ට යෙදුන සකෝලයකට සුමානයකට අඩුගනනේ දවස් හතරක් යවන්ට ඕනෑය. නියම ප්‍රකාර සකෝලයට නොයන්නාවූ යම් ලමයෙකුගේ දෙමවුපියෙක් නොහොත් භාරකාරයෙක් දඩයකට යටත්ය.

22. සකෝලේ ගුරුවරයා විසින් සකෝලයට යන්න සහ නිතිපතා යන්න ලමයින්ගේ දෙමවුපියන්ගේ නොහොත් භාරකාරයින්ගේ නම් ලැයිස්තුවක් සාදා සභාපතිතැනට නොහොත් කොම්පියේ ප්‍රධානතැනට යවන්ට ඕනෑය. එසේ ලැයිස්තුව ලැබුන විට සභාපතිතැන නොහොත් ප්‍රධානතැන දෙමවුපියන්ට නොහොත් භාරකාරාදීන්ට ඒ ගැණ කාරනා කියාහිටින්නට නියම කාල විට කියාහිටින කාරණ ඒත්තුගන්ට නොසෑහේනම් නොම්මර 21කේ ව්‍යවස්ථාවේ ප්‍රකාර ඔවුන්ට විරුඬව නඩුදමන්ට නියමකරන්ට ඕනෑය.

23. සභාපතිතැනගේ හෙවත් ප්‍රධානතැනගේ කල්පනාවේ අන්දමට යම් දෙමවුපිය භාරකාරාදීන් විසින් ඔවුන්ගේ දරුවන්ට ඉගැන්වීම පිණිස යම් සෑහෙන මාර්ගයක් සලස්වා තිබෙනවානම් නොම්මර 21කේ ව්‍යවස්ථාවේ ප්‍රකාර ඔවුන්ගේ ලමයින් සකෝලයට ඇරීමට බැඳීනැත.

24. ආණ්ඩුවෙන් ආධාර ලැබීමට රිජිස්ට්‍රකර තිබෙන සකෝලයක කලමනාකාරයා නොහොත් කලමනාකාරයෝ විසින් ආගම උගන්වන්නට බලකරන්නේ නැති බවට සහ සකෝලේ අකුරු ඉගැන්වීමට නියම පැයගනන තුලදී, ආගම් සම්බන්ඩ ඉගැන්වීමක් කරන්නේ නැත කියා ඒජන්තඋන්නාන්සේගේ මාර්ගයෙන් ලියමනකින් සහතික කරන්නට යෙදුනොත් එම සකෝලයට කොම්පියේ උදවු ලබාගන්ට පුළුවන්වේය.

25. ඉහතකී ප්‍රකාර සහතික ලියමනක් ලැබුන විට නොම්මර 21කේ ව්‍යවස්ථාවේ ප්‍රකාර ලමයින් ඇරීමට සැලැස්වීමට පමනක් භාරගන්නවාද නැත්නම් නොම්මර 19යේ ව්‍යවස්ථාවේ ප්‍රකාර ගම්සභා සකෝලයක් හැටියට ඒත්තුගෙණ සකෝලගෙය සෑදීමද, ප්‍රවේසම්කෙරීම සහ අළුත්වැඩියා කෙරීමද කොම්පිය විසින් කරන්නට භාරගන්නවාද යන වග කොම්පිය විසින් තීන්දුකරගන්නට ඕනෑය.

26. නොම්මර 17තේ ව්‍යවස්ථාවේ ප්‍රකාර කොම්පියට ආණ්ඩුවෙන් උදවුවක් නොලැබෙනවානම් නොම්මර 24රේ ව්‍යවස්ථාවේ ප්‍රකාර සකෝලයක කලමනාකාරයෙක් නොහොත් කලමනාකාරයෝ ලියමනකින් සහතිකයක් දී සකෝලයක් තැබීමට අවසර ඉල්ළු විටක එකී ඉල්ලීම ඒත්තුගැණීමට කොම්පියේ කල්පනාවේ අන්දමට වියයුතුයි. එසේ භාරගත් විට එකී සකෝලය ගම්සභා සකෝලයක් හැටියට ඒත්තුගෙණ සකෝලගෙය සෑදීමද, ප්‍රවේසම් කෙරීමද, සකෝලයට ලමයි ඇරීම ගැනද ක්‍රියාකෙරීමත් නොම්මර 18, 19, 20, 21කේ ව්‍යවස්ථාවල ප්‍රකාර වියයුතුයි.

3 වෙනි සුළු කාණ්ඩය.—මස් මරන ස්ථාන.

27. සුළු කොට්ඨාසයක පදින්චිකාරයින්ට මස්මැරීමට තිබෙන ස්ථානයක වෙනයම් කෙනෙක් විසින් වස හෝ ඩයිනමයිට් හෝ වෙනත් දියේ පිපිරෙන දේවල් නොහොත් පලාතේ සිරිත්ප්‍රකාරයට විරුඬව යම් දෙයක් දමා මස් මරන්නට යුතුනැත.

4 වෙනි සුළු කාණ්ඩය.—තණ බිම්.

28. ගවයින්ට තණ කැවීමට ඕනෑකරන තණබිම් කොම්පිය විසින් ඒජන්තඋන්නාන්සේගේ මාර්ගයෙන් ආණ්ඩුවෙන් ඉල්ළුම්කරන්නට ඕනෑය. තණ කැවීම පිණිස මොන මොන ඉඩම් ආණ්ඩුවෙන් ලැබුනාද, එය මොන ගමේ නොහොත් ගම්වල ප්‍රයෝජනයටද කියා අනබෙර ලවා ප්‍රසිඬකරන්නට ඕනෑය.

29. එයාකාර දුන් තණබිමක් එළිකර වැට බැඳ පොකුන සාදන්ට ඕනෑය කියා ඒජන්තඋන්නාන්සේ විසින් තීන්දුකරන්නට යෙදුනොත් තණකොළ කෑමට සිරිත්ප්‍රකාර ඇරලා සිටින හරක් අයිතිකාර සෑමදෙනා විසින්, කොම්පිය විසින් තීන්දුකරනා හැටියට එක් එක්කෙනාට අයිති වයස අවුරුද්ද එකෙන් වැඩිවූ හරකුන්ගේ ගනනේ ප්‍රමානයට වැඩකොටස බෙදාගෙන වැඩකරන්නට ඕනෑය.

30. දොරකඩවල් නොහොත් කඩුළුද වැටවල් අළුත්වැඩියා කරන්ට ඕනෑ කාලයද, හරක් ගාල්කෙරීම සහ කඩුළු ඇහිරීම ආදියද සම්බන්ඩ විස්තර කාරනා කොම්පිය විසින් නියමකර ගමේ නොහොත් ගම්වල අනබෙර ලවා ප්‍රසිඬ කරන්නට ඕනෑය.

31. යම් කෙනෙක් අප්‍රවේසමෙන් හෝ ක්‍රෝධ කල්පනාවකින් නොම්මර 29 සහ 30 දරන ව්‍යවස්ථාවල සඳහන් යම් වැඩකට අනතුරක් කෙරීම, දොර

කඩ නොහොත් කඩුල්ලක් ඇරීම පොකුනු වතුර කිළුටුකෙරීම නොහොත් එකී වතුරට වස දැම්මද නොකල යුතුයි.

32. වැසියන්ගේ වෙනත් පොදු ප්‍රයෝජනයට ඕනෑ ආණ්ඩුවේ ඉඩම් කොමිටිය විසින් ඒජන්තඋන්නාන්සේගේ මාර්ගයෙන් ආණ්ඩුවෙන් ඉල්ලීම්කල යුතුයි. එවැනි ඉල්ලීම් ඉඩදුන් විට ඉඩමේ වැට බඳින්ට සහ එළිකරන්ට සහ වෙන දෙයක් කරන්ට ඕනෑනම් එම වැඩ ප්‍රයෝජන ලබන අයවළුන් විසින් ගම්සභා කොමිටිය විසින් තීන්දුකරන හැටියට පොදු වැඩෙන් කරන්ට ඕනෑය.

33. ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේගේ හෝ සභාපතිතැනගේ හෝ කොමිටියේ ප්‍රධානතැනගේ හෝ ලියවිල්ලක් නැතුව පතනකට හෝ ගවයින්ට තණ කෑමට වෙන්කල බිමකට හෝ වෙන පොදු වැඩකට වෙන්කල බිමකට කිසි කෙනෙකුට ගිනිතබන්ට යුතුනැත.

5 වෙනි සුළු කාණ්ඩය.—හේනකම්මාන්ත ආදියෙන් උපදවාගන්නා දේවල්.

34. ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේගේ අවසරයපිට ගමේ ප්‍රයෝජනයට වෙන්කල බිමෙන් කොටසක් එළවළු ආදී වෙනත් ප්‍රයෝජන සහිත වැවිලි වැවීමට වෙන්කෙරීමට කොමිටියට බලය තිබේ. එකී ඉඩම් සූදානම් කෙරීමද, පැවැත්වීමද, වැවීමද නොම්මර 1කේ ව්‍යවස්ථාවේ ප්‍රකාර පොදු වැඩක් මෙන් ඒත්තුගනු ලැබේ.

6 වෙනි සුළු කාණ්ඩය—ගවයින් බෝකෙරීම.

35. බෝවීම සඳහා තබන්ට යෝජනාකරන එළගොන් සහ මීගොන්ද සභාපතිතැනගේ නොහොත් ප්‍රධානතැනගේ ඒත්තුගැනීම සඳහා පෙන්වා එසේ ඒත්තුගන්නට යෙදුනොත් ඒබවට සභාපතිතැන හෝ ප්‍රධානතැන විසින් සහතිකපත්‍රයක් දියයුතුයි. එසේ ඒත්තුගන්න සත්තුනම් ඉතාම හොඳ අඟේඇති සත්තු වියයුතුයි.

36. සහතිකපත්‍රයක් නොලත් සෑම පිරිමි එළගවයෝ උපන් දින පටන් දෑවුරුද්දක් තුල හරියාකාර කප්පාදුකරන්නට හෝ වැඩකන්කරන්නට ඕනෑය. සෑම මීගොන්ම සහතිකපත්‍රයක් ලබානොගත්තොත් උපන් දින පටන් පස්අවුරුද්දක් තුල හරියාකාර කප්පාදුකරන්ට හෝ වැඩකන් කරන්නට ඕනෑය.

37. නොම්මර 35 දරන ව්‍යවස්ථාවේ ප්‍රකාර සහතිකපත්‍ර ලබානොගත් දැනට වයස අවුරුදු 2කටත් හයටත් අතරේ සිටින සෑම පිරිමි ගවයෝම වහාම කප්පාදුකරන්නට හෝ වැඩකන් කරන්නට ඕනෑය.

38. නොම්මර 35, 36, 37 දරන ව්‍යවස්ථාවල් වලංගුවෙන්නේ කොමිටිය විසින් නියමකරගත් පළාත්වල පමනක්ය. එසේකරගත් නියමයක් පළාතේ අනබෙර ලැවීමෙන් ප්‍රසිද්ධ කලයුතුය.

39. ගම්සභා මුදලෙන් ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේගේ කැමැත්ත ඇතුව ගවයෝ බෝකෙරීමට සෑහෙන පිරිමිසත්තු එකෙක් හෝ වැඩි ගනනක් මුදලට ගැනීමට කොමිටියට බලය තිබෙනවාත් ඇර ඉන් සතෙක් ඒ සඳහා පාවිච්චිකෙරීමට යම් කෙනෙක් විසින් දියයුතු මුදල මෙපමනය කියා තීන්දුකෙරීමටත් කොමිටියට බලයතිබේ.

සතුන් මැරීම ගැනය.

40. ඒ සඳහා එගම තුල වෙන්කර තිබෙන්නාවූ ප්‍රසිද්ධ ස්ථානයේ 24ර පැයක් තුල සියළුදෙනාටම දැකීමට තබා තිබා සහ මීටයාකරන නොම්මර F අක්ෂරය දරන පෝරමේ ප්‍රකාර කෝරාලගෙන් අවසරයක් ලබාගන මිස කොයිම සතෙක්වත් මරන්ට යුතුනැත.

41. කෝරලය තුල මරණ සෑම සත්තුන්ගේම රිජිස්ටරයක් කෝරාල විසින් මීට යාකරන නොම්මර G දරන පෝරමේ ප්‍රකාර තැබිය යුතුය. යම් ගවයෙක් මරන්ට යෙදුනොත් 1898 නොම්මර 10 ආඥපනත යටතේ පන වනලද ව්‍යවස්ථාවලට එකඟව ගවලේඛනය තිබීමට පත්විහිටින මුලාදෑනියාට කෝරාල විසින් වහාම රපෝර්තුවක් යැවියයුතුවාත් ඇර සභාපතිතැනගේ හෝ ගම්සභා කොමිටියේ ප්‍රධානතැනගේ මාර්ගයෙන් ඒජන්තඋන්වහන්සේටත් රපෝර්තු කලයුතුය. මෙම රපෝර්තුව සමග ප්‍රථම කුවිතාන්සියක් තිබේනම් ඒකත් යැවියයුතුය.

42. 1898වේ නොම්මර 10 ආඥපනත යටතේ සාදනලද රිජිස්ටරයේ නොපෙනෙන යම් ගවයෙකුට ගවකුසිතාන්සියක් හෝ ගෙණයෑමට දෙන අවසරපත්‍රයක් හෝ පෙන්නා නොසිටියොත් කොයිම කෝරාලකෙනෙකුටවත් එකී ගවයෙක් මැරීමට බලකඩදාසියක් දෙන්ට යුතුනැත.

43. ලෙඩින්සිටින කොයිම් සතෙක් හෝ ගවයෙක් මැරීමට බලකඩදාසියක් දියයුතු නැතුවාත් ඇර එසේ යම් ගවයෙකුගේ මස් කිසිකෙනෙකුට කෑමට ගැනීමට හෝ විකිනීමට යුතුනැත. එසේනුමුත් යම් අහම්බයකින් තුවාලඋන සතෙක් හෝ ගවයෙක් බලකඩදාසියක් නොමැතිව මැරීමට පුළුවන්වත් ඇර එසේ තුවාලවුන යම් සතෙක් හෝ ගවයෙක් මරනනාවූ අය විසින් ඒබව කෝරාලට වහාම රපෝර්තු කලයුතුයි.

6 වෙනි සුළු කාණ්ඩය.—(2) ගවපාළු.

44. හරක්පාළු නවත්වන පිණිස සෑම ඉඩම් අයිතිකාරයෝ විසින්ම තමන්ගේ කුඹුරුවල සහ හේන්වල වැටවල්බැඳ රකින්ට ඕනෑවත් ඇර, තමන්ගේ වතු සහ කමත් වටේ වැටබඳින්නට හෝ අගල්කපා තබන්ට ඕනෑය.

45. හරක් අයිතිකාර හෝ බාරකාර සෑමදෙනාම විසින් රාත්‍රියේ ඔවුන් හරක් බැඳතබන්ට හෝ ගාල්කරතබනනට ඕනෑවත් ඇර දවල් කාලයේදී බෙල්ලේ දන්ඩක් හෝ සොකඩයක් එල්ලාතබන්ට හෝ දෙන්නෙක් බැගින් ඈඳා තබන්නට ඕනෑය. එසේනමුත් වවාපු ඉඩමකට යාම සහ දඩාවතේයාම නැවැත්වීමට මුරකාරයෙක් ඇතුව තණබිම්ක නවත්වන්ට යෙදෙන ගවයින් මේ ව්‍යවස්ථාවට යටත් නැත.

46. වැටකින් හෝ වෙන අන්දමකින් ආරක්ෂාකරන්නට යෙදුන තණබිමකට දමන්ට නොයෙදෙන සෑම මීහරකුන්ටම රාත්‍රිකාලයේදී සොකඩයක් බැඳතිබන්ට ඕනෑය.

47. වවනලද ඉඩමකට හෝ පාරකට යාම නැවැත්වීම පිණිස හාන්ට හෝ විකුනන්ට හෝ වෙන යම් ක්‍රියාවක් සඳහා ගේන්ට යෙදෙන සෑම මීහරකුන්ම මුරකාරයෙක් බාරේ තැබියයුතුයි.

48. තවලන් හරක් වවනලද ඉඩමකට යාම හෝ දඩාවතේයාම වැලැක්වීම පිණිස තවලම අයිතිකාරයා හෝ භාරකාරයා විසින් මුරකාරයෙක් තැබියයුතුයි.

49. කරත්තපාරක හෝ අශ්වයෝ ගෙනයන පාරක නොහොත් එකී පාරක් අසල කොයිම හරකෙක් හෝ සතෙක් දිගවිල්කර තබන්නට යුතු නැතුවාත් ඇර එකී පාරට දඩාවතේ යන්නට ඉඩදෙන්නටත් යුතුනැත.

50. සෑම කුඹුරුයායවල්වලට සහ හේන්යායවල්වලට ඕනෑකරන්නාවූ සිරිත්ප්‍රකාර බැඳියයුතු වැටවල් සහ පැල්ද එකී කුඹුරු සහ හේන් අයිතිකාරයෝ නොහොත් වැඩකරන සියළුදෙනාගේම පොදු මාන්සියෙන් සාදන්ට සහ පවත්වන්ටද ඕනෑය.

51. හරකුන්ට කඩුළුබැඳීම ගැනද, හරක් එක්කාසුකිරීම ගැනද, මුරපැල්වල මුරකිරීම ගැනද, ගවයින් ගාල්කිරීම ගැනද, ඕනෑකරන සෑම පිළිවෙත්ම ගම්සභා කොම්පිය විසින් තීන්දුකරගන ගම්වල අනබෙර ලවා ප්‍රසිඬ කලයුතුයි. මේ කාරනාවට ඇතුලත් සියළුදෙනා විසින්ම කොම්පිය විසින් නියමකරන හැටියට පිළිපැදිය යුතුයි.

52. සතුන්ගේ පාළුවක්නිසා බඳින්නට යෙදෙන යම් සතෙක් බාරගන්නට හෝ අලාබය තක්සේරුකරන්නට යම් ආරච්චිලකෙනෙකුට හෝ වෙන මුලාදෑනියෙකුට කියා සිටිච්ච සෑහෙන කාලයක් තුලදී එසේ කර නොමමර H අක්ෂරය දරන පෝර්මය ප්‍රකාර රපෝර්තුවක් දියයුතුයි.

6 වෙනි සුළුකාණ්ඩ—(3) ගවරෝග.

53. වසංගත නොහොත් බෝවෙන රෝගයක් වැලඳුනාවූ යම් සතෙකුගේ භාරකාරයා නොහොත් අයිතිකාරයා විසින් ඒබව ගම්මුලාදෑනියාට එකවිටම දැනුම්දිය යුතුය. එකී ගම්මුලාදෑනියාද ලෙඩබව දැනගන්ට ලැබුන සතා ගවහලෙන් වෙන්කොට එකී ගමට ගව ඉස්පිරිතාලයක් සාදා නොතිබුනේ නම් අයිතිකාරයාගේ වියදමින් වෙන ස්ථානයක මඩුවක් සාදා වෙන්කොට තැබියයුතුයි.

54. ගවඉස්පිරිතාලයක් හෝ ගාලක් නොහොත් ගවකොටුවක්ද ගවයින් භාරකාරයන් නොහොත් අයිතිකාරයින්ගේ හෝ මහන්සියෙන් තැනීමට නියමකිරීමට කොම්පියට බලය ඇතුවාත් ඇර, සෑම ගව අයිතිකාරයෝම තමුන්ට අයිති ලෙඩවූ සෑම සත්තු එසේ සාදනලද ඉස්පිරිතාලයට, ගාලට නොහොත් ගවකොටුවට යවන්ට බැඳී සිටිනවාය.

55. ලෙඩවූ යම් සතෙක් බාරකාරයා නොහොත් අයිතිකාරයා විසින් අත්කැරිය යුතුය.

ඒසතා පිරිසිදුව තිබීමත් දවසකට දෙවරක් ළඟ සිටිය ගාල සුඩකිරීමත් ඔහු විසින් කලයුතුවත් ඇර ආරච්චිල නියමකරන අන්දමට සතාට සාත්තුකිරීමත් ඔහු විසින් කලයුතුය.

56. රෝගය නොපවතිනබව ආරච්චිල විසින් සහතිකකරනතුරු බෝවෙන රෝගයකින් සුවය ලැබූවාවූ සතෙක් ළඟ සිටි ස්ථානයෙන් අන්තැනකට ගෙණගිය යුතු නැත.

57. බෝවෙන රෝගයකින් මැරුණාවූ යම් සතෙක්, හෝ වසම තුල මැරෙන්ට යෙදෙන අනිකුත් සියළු සතුන්ද පොලවෙන් අඩි හයක් යට වැලලීමට ආරච්චිල විසින් නියමකරවියයුතුය. ගව අයිතිකාරයා නොහොත් භාරකාරයා කවරෙක්ද නොදන්නේනම් එසේ වලලනලද එක එක සතාට ගම්සභා අරමුදලෙන් රුපියලක ගාස්තුවක් ආරච්චිලට ලැබේ.

58. තමාගේ වසමතුල බෝවෙන රෝගයෙන් පෙලෙන්නාවූ සෑම සතුන්ම ඇල්ලීමටත් ලෙඩරෝග පවතින්නේයයි කල්පනාවෙන ස්ථානවලට ඇතුල්ව එතනින් එකී සත්තු අහක්කිරීමටත් ආරච්චිලට බලයතිබේ.

59. ගවවසංගතය පවතින්නාවූ ගමකින් වෙන ගමකට හෝ කොඩාසය කට ගවයින් ගෙනයාමවත් එබඳු ගමකට හෝ ගමක් මැදින් ගවයන් ගෙණ යාම හෝ ඊමවත් නොකල යුතුයි.

60. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ සතෙක් අල්වාගැණීම නො හැකිනම් අයිතිකාරයා නොහොත් බාරකාරයා විසින් ඌව වෙඩිතිබිය යුතුය. එසේ ඔහු නොකලවිට වැදගත් ගම්මුන් දෙන්නෙක් ඉදිර්පිට ආරච්චිල විසින් ඌව වෙඩිතිබිය යුතුය. එබඳු මලකුනක් ගෙණයාමෙද වැලලීමේද වියදම නොම්මර 57 ව්‍යවස්ථාවේ ප්‍රකාර අයකරගන්ට පුළුවන්වේ.

61. බෝවෙන රෝගයකින් මැරුණාවූ සතෙකුගේ හම හෝ මාංස කිසි වෙකුට ගෙණයාම නුසුදුසුවාත් ඇර ගව අයිතිකාරයෙක් එසේ කිරීමට කිසි වෙකුට ඉඩදීමවත් නොකල යුතුයි.

62. බෝවෙන රෝගයක් ගමේ තවත් පවතින්නේ නැත යන බවට රටේ මහත්මයාට නොහොත් සභාපතිතැනට ඒත්තුගිය විට ලෙඩවූ සතුන්ට සත්කාරකල උපකරණ ආදිය සහ මඩුවළුත් නාස්තිකිරීම ආරච්චිලගේ යුතුකම වේ.

63. ආරච්චිල ඉදිර්පිටදී මිස ගවයෙකුගේ අං කැපීම කිසිවෙක් විසින් නොකලයුතුයි.

ආරච්චිලද වර්ෂ 1898වේ 10 ආඥාපනතේ ව්‍යවස්ථාවල දක්වන ප්‍රකාරයට රෙජිස්ට්‍රරය ලියාතබන මුලාදෑනියා වෙත ඒබව එකෙනෙහිම රපෝර්තු කල යුතුයි.

7 වෙනි සුළු වගන්තිය—මායිම්.

64. කොඩාසයතුල තිබෙන පුද්ගලික ඉඩම් නොහොත් වැසියන්ට අයිති ඉඩම්වල මායිම් රටේ සිරිත්ප්‍රකාර වැට්වල් අගල් පොලවට ගිල්වා සවිකරපු ගල් නොහොත් ගල්වැටවල්වලින් ලකුනුකල යුතුය. එබඳු මායිම් එහි දෙපැත්තේ තිබෙන ඉඩමේ අයිතිකාරයින්ගේ පොදු වියදම්කෙරීමෙන් තැනිය යුත්තේය.

65. යම් පුද්ගලික හෙවත් වැසියන්ට අයිති ඉඩමක් ආණ්ඩුවේ ඉඩමකට යාව තිබෙනකල මායිමට යම් වැටක් හෝ තාප්පයක් ඇතුව තිබුනේවීනමුත් අඩි දෙකක් ජඹුරත් අඩි දෙකක් පලලත් ඇති අගලකින් ලකුනුකලයුතුවාත් ඇර එබඳු අගලක් ආණ්ඩුවසන්තක ඉඩමේ බදුකාරයෙක් පදින්චිව නැත්නම් පුද්ගලික හෙවත් වැසියන් සන්තක ඉඩමේ පදින්චිකාරයා නොහොත් අයිතිකාරයා විසින් සෑදිය යුතුයි. එසේ බදුකාරයෙක් සිටිනම් 64 වෙනි ව්‍යවස්ථාවේ ප්‍රකාර එය සෑදවිය යුතුයි.

8 වෙනි සුළු වගන්තිය—කුනුකසල ආදි පිලිකුල් දේ.

66. මනුෂ්‍යයාගේ කෑමට නොසෑහෙන නොහොත් අසනීප කෙනදෙන්නාවූ කෑමක් කිසිවෙක් විසින් වෙලඳාමට තැබියයුතු නැත.

67. ගම්පාරක හෝ සුළුපාරක හෝ ප්‍රසිඩ ස්ථානයක කිසිකෙනෙක් විසින් කැතකරන්නට හෙවත් පහරන්නට යුතුනැත.

68. යම් සතෙක් මැරෙන්නට යෙදුනොත් එකී සතාගේ මලකුන කල් ප්‍රමාදනොකර අයිතිකාරයා විසින් වලේදමන්නට ඕනෑවත් ඇර එසේ නැතුව එකී මලකුනට වෙන යමක් කරන්නට යුතුනැත. අයිතිකාරයා එසේ නොකර පැහැර අරිනවානම් ගමේ මුලාදෑනියා විසින් එකී මලකුන වලේදමන්නට ඕනෑවත් ඇර සතා අයිතිකාරයාගෙන් නොහොත් බාරකාරයාගෙන් එසේ වැලලීමට උන වියදම් අයකරගන්නට පුළුවන.

69. රාත්‍රිගතව ඝෝෂාකෙරීමෙන් හෝ කෑත සිවුපද කීමෙන් හෝ වෙන යම් කෝලාහලයක් කෙරීමෙන් කිසිවෙකුට පොදුජනයාගේ විවේකය කඩ කරන්නට යුතුනැත.

70. ප්‍රසිඩ පාරවල් අසල පදින්චිකාරයෝ විසින් පාර අයිනේ ලීදඬු පැදුරු රෙදි කුනුකසල වී මලකුනු ගෙඩිජාති එන්සාල් කෝපි හෝ වෙන ඒ සමාන යමක් තැබීම සහ බඩුපැටවීමට හෝ බඩු බෑමට මිස වෙන ප්‍රස්තාවක කරත්ත නවත්වා තැබීමද තහනම්ය.

71. යම් ගහක් හෝ ගහක අත්තක් හෝ ගහක ගෙඩියක් යම් පාරක වැටේය කියාත් එසේ වැටීමෙන් පාරේ යන එන අයගේ ආරක්ෂාවට බාධාවක්ය කියාත් ගම්සභා කොම්ටියේ ප්‍රධානතැනට හෝ සභාපතිතැනට කල්පනා වෙනවානම් එකී ගහ පිහිටි ඉඩම අයිතිකාරයාට හෝ එහි පදින්චිකාරයාට සභාපතිතැන හෝ ප්‍රධානතැනු විසින් එකී ගහ හෝ අත්ත හෝ ගෙඩිය අහක්කරනලෙස නියමකර ලියවිලකින් නොතිසියක් දියයුතුයි. එකී නොතිසිය ලැබුන 24 පැයක් තුලදී ඒවා අහක්කෙරීම එකී අයිතිකාරයාගේ හෝ පදින්චිකාරයාගේ යුතුකමක් වේ.

9 වෙනි සුළු කාණ්ඩය—බැනීම.

72. යම් කෙනෙක් තරහකරන අදහසින් හෝ එසේ තරහවෙන්ට පුළුවන්බව දැනගනම හෝ සමාදානය කඩකෙරීමක් වෙන්ට පුළුවන් අන්දමට කිසිකෙනෙක් විසින් අපහස වචන පාවිච්චිකරන්ට හෝ බනින්ට යුතුනැත.

10 වෙනි සුළු වගන්තිය.—රා මැදීම.

73. කිතුල්ගහකට නොහොත් පොල්ගහකට බඳිනලද වැල් නොහොත් කඹ සහ ගහට නගින උනගහද හමාසයකට වරක් පොල්ගහේ නොහොත් කිතුල්ගහේ මල් කපන්නා විසින් අළුත්කල යුතුයි. හමාසයකට වැඩි කාල යක් කිතුල්ගහකට බැඳ තබනලද උනගහක් කිසිවෙක් විසින් පාවිච්චිකල යුතු නැත.

74. වසමේ ආරච්චිල විසින් හයමාසයකට වරක් සෑම හැර බඳිනලද කිතුල් සහ පොල්ගස්වල උනබම්බු බලා ඒ වෙනුවට ඕනෑනම් අළුත් ඒවා බඳිනලෙස නියමකල යුතුයි.

11 වෙනි සුළු කාණ්ඩය.—තුවක්කු බැඳීම ආදිය.

75. සභාපතිතැනගේ හෝ ප්‍රධානතැනගේ අවසරයක් නැතුව තුවක්කු බැඳීමද, උගුල් සහ හබක් ඇදීමද, වලවල් හෑරීමද, මිනීපන්දමේ යාමද මෙයින් තහනම්ය. එසේ අවසරයක් දුන්විට සභාපතිතැන හෝ ප්‍රධානතැන විසින් ඒ වග ගමේ ප්‍රසිඞලෙස ප්‍රකාශකලයුතුයි. එසේ නමුත් කොටි හෙවත් දිවියෝ නාසතිකෙරීමට තුවක්කු බැඳීම ආදියට වසමේ ආරච්චිලගෙන් අවස රය ලබාගන්නට පුළුවන්වාත් ඇර එසේ අවසර දුන්විටත් ඒ බව ආරච්චිල විසින් ගමේ ප්‍රසිඞකල යුතුයි.

12 වෙනි සුළු කාණ්ඩය.—සුදුකෙළිය, කුකුල්පොර ඇරීම ආදිය.

76. වර්‍ෂ 1889යේ 17 වෙනි අනාඥවේ තුන්වෙනි වගන්තියේ දක්වන ප්‍රකාර නීතියට විරුඞව සූදුව තහනම්ය. ඔට්ටුවක් ඇතුව හෝ නැතුව කුකුල්පොර ඇරීමද, ඔට්ටුවක්පිට සෙල්ලමක් කෙරීම හෝ යම්කෙනෙකුගේ ගෙදරක නොහොත් වත්තේ ඔට්ටු ඇල්ලීමක් කරන්ට ඉඩදීමද කිසිවෙකුට යුතුනැත.

77. ප්‍රසිඞ පාරක කරත්ත හෝ තිරික්කල රේස් ඇරීමට හෙවත් තරඟේට ඔට්ටු තියා දුවවීමට අවසර නැත.

13 වෙනි සුළු කාණ්ඩය.—උසාවි.

78. ගම්සභාපතිතැන කෙනෙකුට හෝ ගම්සභා කොම්ටියකට නඩු ඇහී මට උසාවි සෑදීමද, අළුත්වැඩියා කිරීමද, පැවැත්වීමද, නොම්මර 1යේ ව්‍යව ස්ථාවේ ප්‍රකාර පොදු වැඩක් මෙන් කලයුතුයි.

79. ගම්සභා ගොඩනැගිලි අලාපාළු කෙරීමට ගවයින්ට එළවන්ට හෝ බැට්ළුවන්ට ඉඩදීම කිසිවෙකුට යුතුනැත. මෙම ව්‍යවස්ථාව යටතේ පැමිණි ල්ලක් ගන්න අයට දඩයසත මුදලෙන් දෙකෙන් කොටසක් දෙනුලැබේ.

14 වෙනි සුළු කාණ්ඩය.

ගම්වැසියෝ විසින් පත්කරගන්නා මුලාදෑනීන්ගේ යුතුකම්.

80. මුල් ආඥපණතේ 10 වෙනි 11 වෙනි වගන්ති යටතේ පත්කරණලද මුලාදෑනියෙක් හෝ වෙන යම් මුලාදෑනියෙක් ඔහුට මෙම ව්‍යවස්ථාවලින් නියමකල යම් යුතුකමක් ඉෂ්ටනොකලොත් ඔහු දඩයකට යටත්ය.

81. මෙම ව්‍යවස්ථාවලින් නියමකර තිබෙන බලය කැමැත්තෙන්ම නො සෑහෙන අන්දමට පාවිච්චිකෙරීම ගැණ හෝ තමන්ට ඇති බලයට වැඩිය ක්‍රියාකෙරීම ගැණ හෝ, මෙම ව්‍යවස්ථා පිළිපැදීම බැරිය කීම නොහොත් පිළි නොපැද පැහැර ඇරීම ගැණ වරදකාරයාවූ සෑම මුලාදෑනියාම දඩයකට යටත්ය.

82. ඉල්ලා අහක්වෙන්ට, මාරුකරන්ට, නිලෙන් අහක්කරන්ට හෝ නිලෙන් තහනම් කරන්ට යෙදුන යම් මුලාදෑනියෙක් ඔහු නිලෙන් අහක්කර න්ට යෙදුන තුන්දවසක් තුල ඔහු බාරේ තිබෙන රිජිස්තරයද, සෑම ආඥ පොත්ද, ව්‍යවස්ථාපොත්ද, රාජකාරි සම්බන්ධ සෑම ලියකියවිලිද කොම්ටියේ සභාපතිතැනට හෝ ප්‍රධානතැනට බාරදී කුවිතාන්සියක් ලබාගත යුතුයි.

16 වෙනි සුළු වගන්තිය.—පාරවල්.

83. යම් කොඨාසයක නොහොත් කොඨාස දෙහෙක නොහොත් ඊට වැඩි ගණනක කොම්ටිය නොහොත් කොම්ටියවල් විසින් පලල අඩි දෙලහකට වැඩිනොවන සබහා පාරක් එකී කොඨාසයේ නොහොත් කොඨාසවල එක් ස්ථානයක සිට තවත් ස්ථානයක් දක්වා කලින්කල සෑදීම යුතුයි. තීරනය කරගැනීමටත් එකී පාර යන්නාවූ මාර්ගයත් පාරේ පලලත් නියමකරගැනීම ටත් බලය තිබේ. එබඳු වැඩක් 1 වෙනි ව්‍යවස්ථාවේ ප්‍රකාර පොදු වැඩක් මෙන් කලයුතුයි.

84. එසේ සාදන පාරෙන් ප්‍රයෝජන ලබන එක්එක්කෙනා විසින් එක් අවුරුද්දක ඒ සියළුම වැඩ සඳහා දසදවසකට අඩුව වැඩකලයුතු දවස්ගණන කොම්ටිය විසින් නියමකලයුතුවාත් ඇර එසේ නියමකරගත් අන්දමට ඒ සියළුදෙනාම වැඩකෙරීමට බැඳී සිටිනවාය.

85. මෙම ව්‍යවස්ථා යටතේ වැඩකෙරීමට යටත් යමෙකුට අවුරුද්ද තුල කරන සෑම පොදුවැඩ වෙනුවට අවුරුදුපතා මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම නම් ශත 75 ගෙවීමෙන්ද ජූනි මස 30 වෙනි දිනට ප්‍රථමනම් රුපියල් 1·25 ගෙවීමෙන්ද වැඩෙන් නිදහස්වෙන්ට පුළුවන. එසේ නුමුත් මෙම දින දෙකෙන් කොයි එකකටවත් ප්‍රථම වැඩකරන්ට නියමවුනොත් ඒ වැඩේ පටන්ගන්නා දිනයට ප්‍රථම මුදල ගෙවිය යුතුය.

86. කොයියම් වැඩකින්වත් ප්‍රයෝජනලබන අයය කියා කොම්ටිය විසින් නියමකරන අවුරුදු 18ටත් 56ටත් අතර වයස් ඇති පලාතේ පදිංචි පිරිමියෙක් කොම්ටිය විසින් නියමකරපු වේලාවට සහ කාලය තුල එකී වැඩ නොමමර 84රේ ව්‍යවස්ථාවේ ප්‍රකාර කෙරීමට බැඳී හිටිනවාය.

87. එක එක වසමේ ආරච්චිල විසින් සෑම අවුරුදුවලම ජනවාරි මාසේ පළමුවෙනි දිනට මත්තෙන් ඔහුගේ වසමේ සිටින වයස අවුරුදු 18 සිට 56 වෙන පිරිමින්ගේ නාමලැයිස්තුවක් සාදා එයින් කොපියක් සභාපතිතැනට නොහොත් කොම්ටියේ ප්‍රධානතැනවෙත යවන්ට ඕනෑය.

88. සෑම ආගම්වල ගුරුවරයෝද වර්‍ෂ 1861කේ නොම්මර 10 පාරබඳු ආඥපණත යටතේ වැඩකෙරීමෙන් නිදහස් අයද මෙම ව්‍යවස්ථා යටතේ වැඩකෙරීමෙන් නිදහස්ය. නිදහස්වීමට ඉල්ලන අය ගැන සභාපතිතැන හෝ කොම්ටියේ ප්‍රධානතැන විසින් තීන්දුවක් දියයුතුයි.

89. යම් පොදුවැඩක් පටන්ගන්නට දිනයක් ආරච්චිල හෝ, කෝරාල හෝ, රටේමහත්මයා විසින් නියමකර ඒ වැඩේ කෙරීමට යටත් එක එක අයට මීට යාකර තිබෙන නොම්මර A අක්‍ෂරය දරණ පෝර්මේ ප්‍රකාර අසවල් ස්ථානයේ අසවල් වේලාවට ඔහු විසින් කලයුතු වැඩේට පැමිණෙන්ට ඕනෑය කියා නොතිසියක් බාරදෙවන්ට ඕනෑය. එසේ නුමුත් එකී අයෙක් ගමේ නොසිටියොත් ඔහුගේ ගෙදර පදිංචි යම් අයෙකුට බාරදෙවන්ට ඕනෑය.

90. මෙම ව්‍යවස්ථා යටතේ වැඩකෙරීමට බැඳී හිටින යමෙකුට නියමකරපු ස්ථානයට නොපැමින දවසකට සෑහෙන පමණ වැඩනොකර සිටීම නුපුළුවන.

91. පොදු වැඩක් බාරව සිටින අය විසින් එකී වැඩේ නිමකල බව සභාපතිතැනට හෝ කොම්ටියේ ප්‍රධානතැනට ඒ බව රපෝර්තුකලයුතුවාත් ඇර B අක්‍ෂරය දරණ පෝර්මේ ප්‍රකාර රපෝර්තුවක්ද C අක්‍ෂරය දරණ පෝර්මේ ප්‍රකාර වැඩට නා අයගේ ලැයිස්තුවක්ද යැවියයුතුයි.

92. වැඩේ බාරව සිටින අය විසින් වැඩකල අයට D අක්‍ෂරය දරණ පෝර්මේ ප්‍රකාර කුවිතාන්සියක්ද වැඩවෙනුවට මුදල් ගෙව් අයට E අක්‍ෂරයේ පෝර්මේ ප්‍රකාර කුවිතාන්සියක්ද දියයුතුය.

93. වර්‍ෂ 1892කේ නොම්මර 18 ආඥපනත යටතේ බදුගෙවීමට බැඳිසිටින යම් කෙනෙක් ඇද්ද ඔහු මෙම ව්‍යවස්ථා යටතේ නියමකල වැඩගනනින් දෙකෙන් පඟුවක් කෙරීමට හෝ ඒ වෙනුවට ගෙවන මුදලෙන් දෙකෙන් පඟුවක් ගෙවීමට බැඳීහිටිනවාය.

18 වෙනි සුළු කාණ්ඩය.—ප්‍රසිඬ මාවත්වල ගැවසීම.

94. එලියක් නැතුව සහ එසේ කෙරීමට සෑහෙන හේතුවක් පෙන්වන්ට නුපුළුවන් විට ප්‍රසිඬ පාරවල්වලද, ප්‍රසිඬ ස්ථානවලද ගැවසෙන්ට හෝ ඇවිදිමින් සිටින්ට යමෙකුට යුතු නැත.

20 වෙනි සුළු කාණ්ඩය.—බීම ජාති වික්නීම.

95. පලාත තුල කොයිම අන්දමේ ස්ප්‍රිතු ජාතියක්වත්, එනම් මත්වෙන බීමජාතිද, පොල් සහ වෙනත් තල් කිතුල් ආදී ගස්වගීවලින් සාදන බීමද ,උක්ගස්වලින්සාදන බීමද යනාදී බීමවගීයක් සත්‍රීන්ට විකිනීමමෙයින්තහනම්'.

21 වෙනි සුළු කාණ්ඩය.—ගොවිතැන් පිළිබඳ පුරාන සිරිත් පැවැත්වීම.

96. පුරාන සිරිත් ප්‍රකාර කුඹුරු හාන්ට හා වපුරන්ට නිසි කාලය නියම කෙරීමට කොම්ටියට බලය ත්බේ. හැම සහ වැපිරීමද කොම්ටිය විසින් නියම කරන දිනවලදී කරන්ට ඕනෑය.

22 වෙනි සුළු කාණ්ඩය.—ගම් සම්බන්ධ කාරනා.

97. හේන්යායක් කීපදෙනෙක් එකතුව එලිකල විටක යායේ හේන්කාරයෝ වැඩිදෙනාගේ කැමැත්ත නැතුව කිසිකෙනෙකුට යායට ගිනි තිබිය නොහැකිය.

98. රටේමහත්මයාගේ අවසර නැතුව කැලෑ එලවීම තහනම්ය.

99. යම් අයෙකුට අයිති ඉඩමකදී සතෙක් මරන්නට යෙදුනොත් ඔහුට එම මරන්ට යෙදුන සතාගේ පසසගාතය ලබාගන්ට බලය තිබේ.

100. දඩයම් කන්ඩායමක යම්කෙනෙක් විසින් යම් ඇතිකරපු සතෙක් අහම්බෙන් මරන්ට යෙදුනොත් ඒ මරාපු සතාගේ වටිනාකමෙන් දෙකෙන් පන්ගුවක් මරාපු අය විසින් ගෙවිය යුතුය. ඉතුරු පන්ගුව කන්ඩායමේ අනිත් අය විසින් එකාකාර බෙදාගන ගෙවිය යුතුයි.

101. පොදු තවලම් මන්ඩි සහ පුද්ගලික තවලම් මන්ඩි ඒවා පාවිච්චි කරන අය හෝ අයවල් විසින් සුබපවිත්‍රව තිබියයුතුය.

102. මේ ව්‍යවස්ථාව පැනවියයුතු සෑම ගම්වලම පදිංචිකාරයින් විසින්ම ඔවුන්ගේ පොදු මාන්සියෙන් ගමේ හෙවත් ගන්ගොඩේ වැටෙන් එපිට වටේට බඹ තිහක් පමණ දුර කැලේ එළිකරන්නට ඕනෑය.

103. යම් ගෙදරවල් අයිතිකාරයෙක් ඇද්ද ඔහුගේ ගෙදර සහ වත්තේ ගෙදර සිට බඹ දහයක් දුර කැනකුනු සහ කැලේ නැතුව එළිපවිත්‍රකෙරීමද, ගොඩකාර ඇලවල් ඇරීමද ගෙදර වත්ත වටේට වැටබැඳීමද ඔහුගේ යුතුකම් වේ.

104. යම් ලිඳක් හෝ වලක් තිබෙන ඉඩමක් අයිතිකාරයා හෝ එම ඉඩම බුත්තිවිඳින අය විසින් එකී ලිඳ හෝ වල වටේ අඩි 2½කට අඩුනොවන උස ඇති බැම්මක් හෝ වැටක් බැඳීමෙන් ආරක්‍ෂා කලයුතුවත් ඇර එකී ලිඳ අඩු ගනනේ අවුරුද්දකට වතාවක් සුබකල යුතුය. මෙම ව්‍යවස්ථාව යටතේ වරදකාරයා වෙන්ට යෙදුන කෙනෙක් එසේ ඒ ලිඳ හෝ වල ආරක්‍ෂාකරන්නටහෝ සුබකරන්නට නොයෙදුනොත් සභාපතිතැන හෝ කොමිටියේ ප්‍රධාන තැන විසින් ගමේ මුලාදෑනියා ලවා ඒ වැඩ කරවාගත යුතුවාත් ඇර වෙන්නාවූ වියදම එසේ වරදකාරයා වෙන්ට යෙදුන අයගෙන් අයකලයුතුයි.

105. ආරච්චිල විසින් ඔහුගේ වසමට අමුතුවෙන් පැමිණෙන්නාවූ සෑම අයවල් ගැණිමර ටේටි මහත්මයාට රපෝර්තු කලයුතුයි.

106. මඟල්‍යයක්, පෙරහැරක්, පින්කමක්, අන්කෙළියක් හෝ වෙනත් බොහෝ ගණිනක් සෙනග රැස්වෙන්නාවූ යම් ක්‍රියාවක් හෙවත් ප්‍රස්ථාවක් කරවන්නාවූ හෝ එවැනි ප්‍රස්ථාවකදී කලමනා කරන්නාවූ විහාරදේවාලවල බාරකාරයෝ හෝ වෙන අයවල් විසින් එම මඟල්‍යයට හෙවත් රැස්වීමට පැමිණෙන්නාවූ සෑම ස්ත්‍රී පුරුෂයින්ට සෑහෙන පමණ කක්කුස්සි හෙවත් වැසිකිලි සාරතැබීමට සහ එකී ඉඩම අපිරිසිදුව නොතැබීමටද, ඒවා සුබකරන්නට අයවල් තැබීමටද බැඳීසිටිනවා ඇත. පිරිමින්ට සාදන කාමර ස්ත්‍රීන්ට සාදන ඒවායින් වෙන්කර සෑදියයුතුය.

107. යම් මුලාදෑනියෙක් අත තිබෙන සෑම රාජකාරිය සම්බන්ධව ලිය කියමන් වැඩද, රිජිස්ටර්ද, වෙනත් ආණ්ඩුවේ ලියකියමන්ද, ඕනෑ විටක ගෙන්වා බැලීමට සභාපතිතැනට හෝ කොමිටියේ ප්‍රධානතැනට බලය තිබේ.

108. යම් ගමකට වැටහෙන හෙවත් අයිති යම් වැඩකට කුලිවැඩට එන්ට සමෙක් පොරොන්දුවී බැඳුනොත් ඔහුට ඒ පොරොන්දුව කඩකරන්ට නුපුළුවන.

109. වෂී 1889යේ නොම්මර 24රේ ආඥපනතේ දහඅවනි වගන්තිය යටතේ සැලැස්වූ නීලවලට ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේ විසින් පත්කරන අයවළුන්ට ඉහතකී ආඥපණතේ නොම්මර 12 වගන්තියේ ප්‍රකාර මෙහි පහත දක්වන ගාස්තු අයකරගන්ට පුළුවන.

| | රු. | ශ. |
|---|---|---|
| ගවයෙක් දවසක් ප්‍රවේසම් කෙරීමට ... ... | 0 | 12 |
| මැරීමට බලය දීමට ... ... ... ... | 0 | 25 |
| මුලාදෑනියාගේ ගෙදර සිට පාළුකරනලද ඉඩමට හැතැප්ම තුනට වැඩිනම් වැඩිවූ එක එක හැතැප්මට ... ... | 0 | 10 |
| ගව පාළු රපෝර්තුවට ... ... ... ... | 0 | 25 |
| ලෙඩ ගවයෙකු ප්‍රවේසම් කෙරීමට දවසට ... ... | 0 | 25 |
| මළ සතෙක් වැලලීමට අයිතිකාරයා ගණනේ ... ... | 1 | 50 |
| ගම්සභා මුදලෙන්නම් ... ... ... ... | 1 | 0 |

---

A.

නමටයි.

වෂී ——— රේ ——— ගවනි ඉලක්කමේ ආඥපණතේ ප්‍රකාර

කල්මත්තෙන් ගෙවා වැඩකෙරීමෙන් නිදහස්වුණෝනම් මිස

නැත්නම් සිට

දක්වා

වැඩකෙරීමු පිණිස

දින සහ ඒ එක්කම දවස් එසේ වැඩකෙරීමට උදය

හපැයට එන්ඩ ඕනෑබව මෙයින් දැනගත යුතුය.

———

මුලාදෑනියා.

B.

වර්ෂ 1889යේ 24 වෙනි ආඥාපනත යටතේ කරණ වැඩවල අනතිම රපෝර්තුවයි.

[10 වෙනි 14 වෙනි 15 වෙනි තීරවල මුළුගණන 5 වෙනි තීරයේ ගණනට සමාන වියයුතුයි.]

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොම්මරය | පොලිස් මජිස්ත්‍රේගේ නම | වැඩකරන්ට බැඳී සිටින මිනිසුන්ගේ ගණන | ගම්සභාව විසින් බැඳීම් ලෙස නියම කළ දින | වැඩකරන්ට පුළුවන් අයගේ ගණන (4 වෙනි තීරයේ ගණන 3 වෙනි තීරයේ ගණනින් වැඩිකළ ගණන) | මුදලට අයකළ ගණන | ගෙවූ අයමුදලේ ගණන | අඩුකළ අයමුදලේ ගණන | හිඟ අයමුදලේ ගණන | 6 වෙනි තීරයේ සිට 9 වෙනි තීරය දක්වා මුළු ගණන | ලැබුණු අයමුදලේ ගණන | වෙන කටයුතු වැඩ කරන අයවලුන්ගේ ගණන | වෙන කටයුතුවලට යෙදවූ මිනිසුන්ගේ ගණන | 11 වෙනි තීරයේ සිට 13 වෙනි තීරය දක්වා මුළු ගණන | කාරණා නිසා නැති අයවලුන්ගේ ගණන | මේ ගැන නියමිත කාරණ |
| | | | | | | | | | | | | | | | |

C.

ගම්සභා බද්ද නොගෙව් අයවලුන්ගේ ලැයිස්තුවයි.

වර්ෂ 189 —— ක්වූ අවුරුද්දේ ———— කෝරළේ ———— පත්තුවේ
———— පලාතේ නොගෙවූ අයවලුන්ගේ ලැයිස්තුවයි.

| කොට්ඨාසයේ පොතේ නොම්මරය | බද්ද නොගෙවූ අයගේ නම | ගම | නොගෙවූ අවුරුද්ද | බදු ගණන | වැඩකරන්ට බැඳී සිටින දින ගණන | ප්‍රධාන මුලාදෑනියා විසින් සම්පූර්ණකරන්ට | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | නඩුවේ නොම්මරය | නඩු තීන්දුව |
| | | | | | | | |

වැඩ කලඹ වට දෙන තුවිතාන්ෂිය.

D

| | |
|---|---|
| නොම්මරේ —— . | නොම්මරේ —— . |
| ගම ———— . | ගම ———— . |
| නම ———— . | නම ———— . |
| වැඩකළ වෙලාව ———— . | වැඩකළ වෙලාව ———— . |
| කොහිවැඩපොලේද ———— . | කොහි වැඩපොලේද ———— |
| මුලාදෑනියාගේ අත්සන———— . | මුලාදෑනියාගේ අත්සන ———— . |

වැඩ වෙනුවට මුදල් ගෙවූ බවට කුවිතාන්සිය.

## E

මෙහි පහත සඳහන් අයගෙන් ගම්සභා ආඥාපනත යටතේ වැඩවෙනුවට
රු. ——— ක් බාරගන්ට යෙදුනා ඇත.

| | |
|---|---|
| නොම්මරය ——— . | නොම්මරය ——— . |
| පලාතය ——— . | පලාතය ——— . |
| පත්තුව ——— . | පත්තුව ——— . |
| ගම ——— . | ගම ——— . |
| නම ——— . | නම ——— . |
| ගෙවාපු දිනේ ——— . | ගෙවාපු දිනේ ——— . |
